සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2012

# පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2012 අගෝස්තු

## I පත්‍රය

මිනිත්තු 45

විභාග අංකය ........................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙමප්‍රශ්න පත්‍** සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු **තුන** බැගින් දී ඇත. ඒවා අතුරෙන්, **එක් එක් ප්‍රශ්** අදාළ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කේත අත්සන හා සංකේත අං |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි අවසාන ලකුණ නිවැරදිය | V/I/S/CH |

[2 වැනි පිටු


- දී ඇති උපදෙස් අනුව අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සොයා, නිවැරදි පිළිතුර යටින් ඉරක් **අඳින්න.**


- වඩාත් ම **සමීප සම්බන්ධතාව** ඇති රූප යුගලය ඇතුළත් කොටුව තෝරන්න.

1. 
(1)

(2)

(3)

2. 
(1)

(2)

(3)

- සතුන්ගේ රූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.


A

B

C

D

E

3. එකිනෙකා සමඟ මිතුරුව ජීවත්වීමට වඩාත් ඉඩ ඇති සතුන් දෙදෙනා,
(1) A සහ D ය. (2) B සහ C ය. (3) B සහ E ය.

4. විශාල ම සතා සහ කුඩා ම සතා වන්නේ,
(1) A සහ B ය. (2) C සහ D ය. (3) D සහ E ය.


P

Q

R

S

T

5. P සහ Q දෙදෙනා අනෙක් සතුන්ගෙන් වෙනස් වන ලක්ෂණය කුමක් ද?
(1) මස් පමණක් ආහාරයට ගැනීම
(2) ගෘහාශ්‍රිතව වාසය කිරීම
(3) රාත්‍රී කාලයේදී ක්‍රියාකාරී වීම

6. Q සහ R සතුනට විශේෂ වන නමුත් P සහ S සතුන් ළඟ **නොමැති** ලක්ෂණය කුමක් ද?
(1) පලතුරු ආහාරයට ගැනීම
(2) සංචාරක පක්ෂීන් වීම
(3) ජලය ආශ්‍රිතව වාසය කිරීම

[3 වැනි පිටුව බලන්න

විභාග අංකය ..................................

පහත දැක්වෙන කවිය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

සිත ගත සනසන සිසිලස ගෙන දෙන
මඳ නල තුරුලිය සිඹිමින් මෙහි එන
විඳිනාට නිරතුරු නල යුතු මහ පින
සුරැකුම ගහ කොළ තිබී අප පණ මෙන

කවියට අනුව, සිතට හා ගතට සැනසුම ගෙන දෙන්නේ,

(1) ගස්වැල් ය.
(2) මඳ නල ය.
(3) නිරතුරු පින් කිරීම ය.

මෙම කවියෙන් අපට කියන්නේ,

(1) සිත ගත සනසන සීතල පුළඟ ගැන ය.
(2) තුරුලිය සිඹිමින් මඳ නල එන ආකාරය ගැන ය.
(3) පරිසරයේ ඇති ගහ කොළ සුරැකිය යුතු බව ය.

**A** සහ **B** වෙනුවට වඩාත් ගැළපෙන වචන යුගල තෝරන්න.

| | | |
|---|---|---|
| එළවළු | පළතුරු | **A** |
| **B** | අඹ | සහල් |
| කරවල | කෙසෙල් | මුං ඇට |

(1) ධාන්‍ය, නැරවි (2) ඉරිඟු, පතෝල (3) කුළුබඩු, කුරුඳු

| | | |
|---|---|---|
| **A** | නැව | ගුවන් යානය |
| අශ්වයා | තල්මසා | **B** |

(1) කරත්තය, උකුස්සා
(2) බයිසිකලය, සරුංගලය
(3) ගිරවා, ලොරිය

හිස්තැනට සුදුසු වචනය තෝරන්න.

**අම්මා** එළවළු ගෙන ඒමට පොළට ගියා ය. **ළමයි** ඉගෙනුම සඳහා පාසල් ගියෝ ය.

**අම්මා** : **ළමයි** නම් පොළට : ........

(1) එළවළු (2) පාසල් (3) ඉගෙනුම

හොඳ **ළමයි** ගුරුවරුන්ගේ බසට කන්දෙති. ජනප්‍රිය **ගායිකාවක්** මියුරු හඬින් ගියක් ගැයුවා ය.

**ළමයි** : **ගායිකාවක්** නම් කන්දෙති : ........

(1) හඬින් (2) ගියක් (3) ගැයුවා ය


[4 වැනි පිටුව බලන්න

- සිත්තමට ගැළපෙන පිළිතුර තෝරන්න.

13.

| | | |
|---|---|---|
| 2 | 7 | 12 |
| 7 | 12 | 17 |
| 12 | 17 | ...... |

20 (1) 22 (2) 25 (3)

14 

......



(1)


(2)


(3)

- දර්පණයක් මත පිළිබිඹු වන විට ඒ ආකාරයෙන්ම පෙනෙන රූප දෙක සහ අකුරු දෙක තෝරන්න.

15.


(1)


(2)


(3)

16.

PE (1) SN (2) AH (3)

- කොටු තුළ ඇති සටහන් දෙක එකිනෙක මත තැබීමෙන් ලැබෙන රූපය තෝරන්න.

17. 

806 (1) 608 (2) 860 (3)

18. 

OHT (1) CUF (2) HOT (3)

[5 වැනි පිටුව බලන්න

- හිස්තැන්වලට සුදුසු පිළිතුර තෝරන්න.

**19.** | 2 | 4 | 6 |  | 3 | 5 | 7 |  | 4 | 6 | 8 |  ............

(1) | 5 | 6 | 7 |  (2) | 5 | 7 | 9 |  (3) | 6 | 8 | 9 |

**20.** ඉරිද, අඟහරුවාද, බ්‍රහස්පතින්ද, සෙනසුරාද, ............, ............

(1) අඟහරුවාද, බ්‍රහස්පතින්ද

(2) සඳුද, බදාද

(3) ඉරිද, සඳුද

- නිවැරදි පිළිතුර තෝරන්න.

**21.** 1, 2, 3, 4, 5 සඳහා E, D, C, F, S අකුරු පිළිවෙළින් භාවිත කර ඇත. ඒ අනුව

```
  C E D
+ D C E
-------
=======
```


පිළිතුර වන්නේ

(1) C S F  (2) S F C  (3) F C S

**22.** රුපියල් 245 ක් D E M ලෙස ද රුපියල් 130 ක් C L N ලෙස ද ඉංග්‍රීසි අකුරු යොදා සට
තිබුණි. ඒ අනුව රුපියල් 435 සටහන් කර ඇති ආකාරය කුමක් ද?


(1) E L M  (2) E C M  (3) M C L

**23.** රූපයේ දක්වෙන ඝන වස්තුවෙහි ඇති පෘෂ්ඨ ගණන කීය ද?




(1) 10  (2) 12  (3) 14


**24.** ළමයෙක් මල් පාත්තියක් සෑදීම සඳහා එක් ස්ථානයක සිට උතුරට මීටර 3ක් ද එ
නැගෙනහිරට මීටර 3ක් ද එතැන් සිට දකුණට මීටර 6ක් ද එතැන් සිට මුල් ස්ථානයට
ඇද බිම සලකුණු කළේ ය. එම මල් පාත්තියේ හැඩය තෝරන්න.



(1)




(2)




(3)

[6 වැනි පිටුව බලන්

රූපවල දැක්වෙන පරිදි කඩදාසියක් තිත් ඉර දිගේ දෙකට නවා, තට්ටු දෙකම හසුවන ලෙස සිදුරු කරන ලදී.



එය නැවත පෙර තිබූ ලෙසටම දිග හැරිය විට දැකිය හැකි ආකාරය කුමක් ද?



(1) (2) (3)

බිස්කට් පෙට්ටි 14 ක් කඩේ සිට ගෙදරට ගෙන ඒමට සමන්ට අවශ්‍ය විය. ඔහුට එකවර ගෙන ආ හැක්කේ පෙට්ටි 4 කි. ඒ අනුව පෙට්ටි සියල්ල ගෙන ඒමට යා යුතු අවම ගමන් වාර ගණන කීය ද?

(1) 3 (2) 4 (3) 5

සදුන්ගේ නිවසේ ඇති ඔරලෝසුවේ වේලාව නියමිත වේලාවට වඩා මිනිත්තු 10 ක් අඩු ය. ඒ අනුව පෙ.ව. 6.30ට නිවසින් පිටත් වූ සදුන් පාසලට යන විට නිවැරදි වේලාව පෙන්වන පාසල් ඔරලෝසුවේ වේලාව පෙ.ව. 7.10 විය. ඔහුට නිවසේ සිට පාසලට යාමට ගත වූ කාලය මිනිත්තු කීය ද?

(1) 50 (2) 40 (3) 30

සවියක ඇති මෙම පේළි පහතෙහි නිවැරදි අනුපිළිවෙළ කුමක් ද?

(W) දෙගුරුන් නමදිමු (M) පාසල වෙත යමු

(N) අලුයම පිබිදෙමු (H) නානකට සැරසෙමු

(1) W N M H (2) N H W M (3) N H M W

**29 සහ 30 ප්‍රශ්නවලට පහත තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

කෙසෙල් ගෙඩි 2 ක මිල රුපියල් 30 කි. පේර ගෙඩියක් කෙසෙල් ගෙඩියකට වඩා රුපියල් 5 ක් වැඩි ය. අඹ ගෙඩියක් පේර ගෙඩියක සහ කෙසෙල් ගෙඩියක මිලෙහි එකතුවට සමාන ය. එසේ නම්,

පේර ගෙඩියක මිල රුපියල්


(1) 20 කි. (2) 15 කි. (3) 10 කි.

අඹ ගෙඩියක මිල රුපියල්

(1) 35 කි. (2) 40 කි. (3) 45 කි.


[7 වැනි පිටුව බලන්න

31. රූපයේ ඇති ත්‍රිකෝණ සංඛ්‍යාවත් සෘජුකෝණාස්‍ර සංඛ්‍යාවත් පිළිවෙළින්



(1) 3, 3 වේ. (2) 3, 5 වේ. (3) 2, 5 වේ.

32. දී ඇති හැඩතල අතුරෙන් තුනක් එකතුකර සෘජුකෝණාස්‍රයක් සෑදිය හැකිය. ඒ හැඩතල මොනවා ද?




(1) 1, 2, 4 (2) 2, 3, 4 (3) 1, 3, 5

33. කොටුව තුළ ඇති කුඩා ම ඔත්තේ සංඛ්‍යාව ලොකු ම ඉරට්ටේ සංඛ්‍යාවෙන් ගුණ කළ විට ලැබෙන පිළිතුර කීය ද?

| | | | | |
|---|---|---|---|---|
| 6 | 5 | 4 | 23 | 15 |
| 7 | 19 | 33 | 8 | 3 |
| 10 | 2 | 30 | 17 | 29 |

(1) 90 (2) 58 (3) 50


34. 2013 වර්ෂයේ හරි මැද දිනය යෙදෙන්නේ කවදට ද?

(1) ජුනි 30 (2) ජූලි 01 (3) ජූලි 02

35. ඔක්තෝබර් 01 ලෝක ළමා දිනයයි. 2013 වර්ෂයේ ජනවාරි 01 සිට ඔක්තෝබර් 01 දින තෙක් ඇති දින ගණන කීය ද?


(1) 273 (2) 274 (3) 275

36. මුළු රූපයේ වර්ගඵලය එහි අඳුරු කර ඇති කොටසේ වර්ගඵලය මෙන් කී ගුණයක් ද?



(1) 8
(2) 10
(3) 12

37. මුළු රූපයේ පරිමිතිය (වටේ දිග) අඳුරු කර ඇති කොටසේ පරිමිතිය මෙන් කී ගුණයක් ද?



(1) 4
(2) 6
(3) 8

[8 වැනි පිටුව බලන්න

38. දී ඇති හැඩයෙන් ඝනකයක් සෑදූ විට එය දිස්වන ආකාරය තෝරන්න.




(1) (2) (3)

39. පඩි 10ක් ඇති පඩි පෙළක A පළමුවෙනි පඩියේත් B දහවෙනි පඩියේත් සිටිති. A එක් පඩියක් ඉහළ නඟින විට B පඩි දෙකක් පහළට බසී නම් ඔවුන් දෙදෙනා හමුවන්නේ කීවෙනි පඩියේ දී ද?

(1) 4 (2) 5 (3) 6

40. තාරක සහ ධීරක වෘත්තාකාර ධාවන පථයක තරඟ දිවීමක් ආරම්භ කළහ. ධීරක වට භාගයක යන විට, තාරක වටයක් සම්පූර්ණ කර ඉදිරියට පැමිණෙමින් ධීරක පසු කළේ ය. ඒ අනුව

(1) තාරකගේ වේගය ධීරකගේ මෙන් තුන් ගුණයකි.
(2) තාරකගේ වේගය ධීරකගේ මෙන් දෙගුණයකි.
(3) ධීරකගේ වේගය තාරකගේ මෙන් තුන් ගුණයකි.

* * *

හිමිකම් ඇවිරිණි]
பதிப்புரிமை உடையது]
s Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**5**

XAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2012

# පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යත්වාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2012 අගෝස්තු

## II පත්‍රය

පැය 1 මිනිත්තු 15 යි.

විභාග අංකය : ..............................

### ට පෙනී සිටින ඔබට උපදෙස්

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න. (සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.)
- පිළිතුරු හතරක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු **තිත් ඉර මත** ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| පළමු පරීක්ෂක<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි | V/II/S |
| දෙවන පරීක්ෂක<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි | V/II/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක<br>ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි | V/II/S/EMF |
| ප්‍රධාන පරීක්ෂක<br>අධීක්ෂණය කළෙමි අවසාන ලකුණ නිවැරදිය | V/II/S/CH |

[2 වැනි පිටුව බලන්න.

**දැක්වෙන ඡේදය හොඳින් කියවන්න.**

කුමාරගුප්තට තම බිරිඳ සිනාසෙන්නේ කුමක් නිසා දැයි යන්තම් අනුමානයෙන් මෙන් සිතාගත ...ි වූයේ, "හොඳයි කිරි තැවා!" යන වචන ඇසූ විට ය.

"මාළු ද?" "ජාඩි!" යැයි කියමින් යසෝමා යළිත් සිනාසෙන්නට වූවා ය. කුමාරගුප්ත දුටුවෙන් ...ගේ සිනාසෙමින් වුව ද මැඩගත් කෝපය ද ඇතිවි ය. ඔහුගේ කුඩා පුතුයාගේ සඳ වන් සොම්නස් ...ණ දොම්නස් වැහි වලාකඩින් වැසිණ.

(පහ ශ්‍රේණියේ, සිංහල පෙළපොතේ, 'කිරි නැ ගැටි' පාඩමෙන් උපුටා ගන්නා ලදී.)

**...වලට පිළිතුරු ඡේදයෙන් ම තෝරා ගෙන, තිත් ඉරි මත ලියන්න.**

(i) මාළුවලින් සැදිය හැකි දෙයක් මෙම ඡේදයේ සඳහන් වේ. ඒ මොනවා ද? :..............................

(ii) කුමාරගුප්තට තම බිරිඳ සිනාසෙන්නේ කුමක් නිසා දැයි යන්තම් අනුමානයෙන් මෙන් සිතා ගත හැකි වූයේ කෙසේ ද? :..............................

(iii) **දීර්ඝ පාපිල්ල** යෙදී ඇති අකුරක් සහිත වචනයක් ඡේදයෙන් ම සොයා ලියන්න.

:..............................

(iv) **'යටපත්කරගත්'** යන **අදහස දෙන** වචනය ඡේදයෙන් ම සොයා ලියන්න. :..............................

(v) **'ඇරිණ'** යන පදයේ **විරුද්ධාර්ථය** දෙන පදය ඉහත ඡේදයෙහි සඳහන් වේ. එය කුමක් ද?

:..............................

(vi) ඡේදයේ සඳහන් **උපමාව** ලියන්න. :..............................

(ඉ) පහත දී ඇති වාක්‍යවල හිස්තැනට ගැළපෙන වචනය **යටින් ඉරක් අඳින්න.**

(i) අද දවසේ .............................. (කාලගුණ/කාලගුණ) තත්ත්වය ඉතා යහපත් ය.

(ii) .............................. (කබ/කඹ) ඇදීම අවුරුදු උත්සවයේ විනෝදජනක ක්‍රීඩාවකි.

(ආ) පහත දී ඇති එක් එක් වාක්‍ය ඛණ්ඩයට **අර්ථයෙන් සමාන තනි වචනය**, තිත් ඉර මත ලියන්න.

(i) ගඟක් මුහුදට වැටෙන ස්ථානය :..............................

(ii) පෘථිවිය හිරු වටා කැරකීම :..............................

(iii) උෂ්ණත්වය නිසා ජලය වාෂ්ප බවට හැරීම :..............................

පහත සඳහන් **ඉංග්‍රීසි වාක්‍යවල අර්ථ සිංහලෙන්** ලියන්න.

(i) What are these? :..............................

(ii) Can you help me? :..............................

පහත සඳහන් වාක්‍යයෙහි **අර්ථය ඉංග්‍රීසියට හරවා ඉංග්‍රීසි අකුරෙන් ම** ලියන්න.


**කරුණාකර දොර අරින්න.** ....................

[3 වැනි පිටුව බලන්න.

විභාග අංකය ..........................

5. එක් එක් පින්තූරයට ගැළපෙන **ඉංග්‍රීසි නම, ඉංග්‍රීසි අකුරෙන් ම** ලියන්න.

(i)  :..........................

(ii)  :..........................

6. පහත සඳහන් වගන්තිය දෙමළෙන් කියන ආකාරය **සිංහල අකුරෙන් ලියන්න.**

**අර මගේ පොත** :..........................

7. පහත සඳහන් වාක්‍යයේ අර්ථය **සිංහලෙන් ලියන්න.**

**ඉදු එමදු වකුප්පු** :..........................

8. මුලින් දී ඇති පදයට **සමාන අර්ථය** දෙන පදය තෝරා **යටින් ඉරක් අඳින්න.**

(i) රජතුමා : දිනිඳු, නරිඳු, නිරිඳු, පසිඳු

(ii) කිරුළ : කිරල, ජේසත, මටුන්න, පිරුළ

(iii) නිසසල : ස්ථිර, චංචල, නිශ්චල, හිර

9. පහත සඳහන් වාක්‍යවල **තද කළු අකුරෙන්** ඇති වචනවල අර්ථය, **තිත් ඉරි මත ලියන්න.**

(i) උන්නෑ අම්මා සහ රන්මැණිකේ **අලුමුසාව** ගෙන වෙලට පැමිණියහ. ..........................

(ii) මෙවර සී සෑමේ මංගල්‍යය ලබන **බුද දින** පැවැත් වේ. ..........................

(iii) **කරත්** මෙන් ගැටුමක් නැති ..........................

- ප්‍රශ්න අංක **10** සිට **39** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් **යටින් ඉරක් අඳින්න.**

10. පෙති හතරක් ඇති මලකට උදාහරණයක් වන්නේ,
(1) සමන්පිච්ච ය. (2) ඉද්ද ය. (3) රත්මල් ය. (4) පේපාලිකා

11. ශ්‍රී ලංකාවට ඒකදේශික ශාකයක් වන්නේ කුමක් ද?
(1) කුප්පමේනිය (2) බිං කොහොඹ (3) හාතවාරිය (4) ගොටුකොළ

12. සතුන් මගින් ව්‍යාප්ත වන බීජ පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
(1) රබර්, ඇහැල, කදුරු (2) කදුරු, කුඩළු, කජු
(3) පිදලිය, පුවක්, කුප්පිරි (4) කජු, නාගදරණ, කුත්තිරි

13. විත් මාරු මිලදී ගැනීමේදී **අඩු ම** අවධානයක් යොමු විය යුතු කරුණ වන්නේ,
(1) කල් ඉකුත්වීමේ දිනයයි. (2) භාණ්ඩය මිලට ගන්නා වෙළෙඳසැලයි.
(3) භාණ්ඩයේ ගුණාත්මක බවයි. (4) භාණ්ඩයේ වෙළෙඳ නාමයයි.

14. [illegible] ලෙස භූමිය සාද ගන්නේ කුමන සත්ත්වයා ද?
(1) කුඹලා (2) නයා (3) වේයා (4) ගෝනුස්සා

[4 වැනි පිටුව බලන්න.

5. වගාවලට හානි කරන සත්ත්ව විශේෂයක් **නො වන්නේ**,
(1) පැලමැක්කා ය. (2) කුඩිත්තා ය. (3) පුරුක් පණුවා ය. (4) බත්කූරා ය.

6. තවාන් සාද පැළ ලබා ගැනෙන බෝග වර්ගයකි,
(1) බතල. (2) කංකුං (3) මිරිස්. (4) පතෝල.

17. වියගහ භාවිත කරනු ලබන්නේ,
(1) මැටි කර්මාන්තයේ දී ය. (2) කෘෂි කර්මාන්තයේ දී ය.
(3) රෙදිපිළි කර්මාන්තයේ දී ය. (4) ලෝහ කර්මාන්තයේ දී ය.

18. **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ශ්‍රී ලංකාව ඉන්දියාවට දකුණින් පිහිටා ඇත.
(2) ශ්‍රී ලංකාව අයත් වන්නේ අප්‍රිකා මහාද්වීපයට ය.
(3) ශ්‍රී ලංකාව කඳුළක හැඩය ගත් දූපතකි.
(4) ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටා ඇත.

19. දකුණු පළාතට අයත් නගරයක් වන්නේ,
(1) කළුතර ය. (2) බලන්ගොඩ ය. (3) අම්බලන්ගොඩ ය. (4) මොනරාගල ය.

20. කොළඹ සිට බදුල්ල දක්වා වැටී ඇති දුම්රිය මාර්ගයේ හමුවන දුම්රිය නැවතුම්පොළකි,
(1) වටවල. (2) හබරණ. (3) සීදුව. (4) වව්නියාව.

21. පෙක්කුව භාවිත කෙරෙන්නේ පහත සඳහන් කුමන කාර්යය සඳහා ද?
(1) බී පැම (2) වී (බැත) හුළං කිරීම (3) තෙල් සිඳීම (4) පිටි කෙටීම

22. 
රූපයෙන් දක්වෙන උපකරණය කුමක් ද?
(1) වැසි අඬුව
(2) දලු අඬුව
(3) බුරුමය
(4) යතු කැටය

23. හිරමනය මුවහත් කිරීම සඳහා භාවිත කෙරෙන උපකරණය වන්නේ,
(1) කියත ය. (2) පිර ය. (3) මිටිය ය. (4) නියන ය.

24. 
රූපයේ දක්වෙන තරු රටාව හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?
(1) හත්දින්නත් තරු
(2) දඩයක්කාරයා
(3) මහ වලහා
(4) කුඩා වලහා

25. අපිරිසිදු ජලය පානය කිරීම නිසා වැළඳෙන රෝගයකි,
(1) සෙම්ප්‍රතිශ්‍යාව. (2) කක්කල් කැස්ස. (3) කම්මුල්ගාය. (4) සෙංගමාලය.

26. ධාතුසේන රජතුමා විසින් කරවන ලද වැවකි,
(1) කලා වැව. (2) අභය වැව. (3) මින්නේරි වැව. (4) ගිරිතලේ වැව.

[5 වැනි පිටුව බලන්න.

27. 

මෙම රූපයෙන් දක්වෙන්නේ,
(1) එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා ය.
(2) ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා ය.
(3) පොන්නම්බලම් රාමනාදන් මහතා ය.
(4) විලියම් ගොපල්ලව මහතා ය.


28. 

කහපාට පසුබිමෙහි කළු පාටින් ඇති මෙම රූපයෙන් දක්වෙන
සංඥාව කුමක් ද?
(1) ගේට්ටුව සහිත දුම්රිය මාර්ගය
(2) ගේට්ටුව රහිත දුම්රිය මාර්ගය
(3) ආරක්ෂා කර ඇති දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙනි
(4) ආරක්ෂා කර නොමැති දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙ

29. 


රූපයේ දක්වෙන සෙවණැල්ලෙන් නිරූපණය වන කුරුල්ලා,
(1) කොකා ය.
(2) කොරවක්කා ය.
(3) කැරලා ය.
(4) කිරලා ය.

30. පහත දක්වෙන රූප අතුරෙන් සියඹලා ශාකපත්‍ර දක්වෙන රූපය කුමක් ද?


(1)


(2)


(3)


(4)


31. ලේන්සුවක මලක් මැසීමේ දී මලෙහි නටුව මසා ගැනීමට වඩාත් ම සුදුසු මැහුම් ක්‍රමය කුමක
(1) නැටි මැස්ම
(2) කතිර මැස්ම
(3) පිස්මේන්තු මැස්ම
(4) බ්ලැන්කට් මැස්ම

32. සන්නිවේදනය සඳහා යොදා ගැනෙන ජනප්‍රිය මුද්‍රිත මාධ්‍යය වන්නේ,
(1) ගුවන් විදුලිය ය.
(2) රූපවාහිනිය ය.
(3) පුවත්පත ය.
(4) අන්තර්ජාලය ය.

33. සිරුරට අවශ්‍ය ප්‍රෝටීන ලබා ගැනීම සඳහා සුදුසු ආහාරයක් වන්නේ,
(1) අර්තාපල් ය.
(2) පරිප්පු ය.
(3) කැරට් ය.
(4) ගොටුකොළ ය

34. මෙම රූපිත ප්‍රකාශනයෙන් කියැවෙන්නේ කුමක් ද?
(1) ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය
(2) මාර්ග සංවර්ධන අධිකාරිය
(3) ලංකා විදුලිබල මණ්ඩලය
(4) ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

35. මදුරුවන් මඟින් බෝවන රෝගයකි.
(1) පාචනය. (2) මැලේරියාව. (3) කොළරාව. (4) උණසන්නිපාතය.

36.



මෙම ජල බඳුනෙහි ඇති A සහ B විය හැක්කේ පිළිවෙළින්,
(1) ලී කැබැල්ලක් හා කාසියකි.
(2) ලී කැබැල්ලක් හා ප්ලාස්ටික් කැබැල්ලකි.
(3) යකඩ කැබැල්ලක් හා ලී කැබැල්ලකි.
(4) යකඩ කැබැල්ලක් හා කාසියකි.

37. ජලයේ දියවන ද්‍රව්‍යයක් වන්නේ,
(1) පොල්තෙල් ය. (2) ඉටි ය. (3) භූමිතෙල් ය. (4) ලුණු ය.

38. විද්‍යුත් චුම්බක භාවිත වන උපකරණයක් වන්නේ,
(1) විදුලි සීනුව ය. (2) ක්‍රමාල බෝට්ටුව ය. (3) විදුලි පන්දම ය. (4) වීදුරු කැමරාව

39. කණ්ඩායම් ක්‍රීඩාවක් වන්නේ,
(1) යගුලිය දැමීම ය.
(2) එල්ලේ ගැසීම ය.
(3) කවපෙත්ත විසි කිරීම ය.
(4) හෙල්ල විසි කිරීම ය.

- **දී ඇති හිස්තැන් මත පිළිතුරු සපයන්න.**

40. ඉලක්කමෙන් ලියන්න. : හත් දහස් හැත්තෑව පහ ..................

41. රටාවේ ඊළඟ සංඛ්‍යා **දෙක** පිළිවෙළින් ලියන්න. 3045, 3035, 3025, 3015 .................. ..................

42. 3, 5, 7 යන සංඛ්‍යාංක යොදාගෙන සැදිය හැකි සංඛ්‍යා හය **ආරෝහණ** පටිපාටියට දක්වෙන හිස්තැන් පුරවන්න.
..........., 375, ..........., ..........., 735, ....

43. (i) දී ඇති රූපයේ $\frac{3}{10}$ ක් අඳුරු කර දක්වන්න.
(ii) එවිට අඳුරු කර **නොමැති ව** ඉතිරි වන කොටස භාගයක් ලෙස දක්වන්න...........................



44. මිතුරෝ පස්දෙනෙක් සමාන ව මුදල් යොදා, එකක් රු. 30 බැගින් දෙළුම් ගෙඩි 8 ක් ද එකක් රු. 50 බැගින් ඇපල් ගෙඩි 6 ක් ද මිලදී ගත්හ.
(i) ඇපල් සහ දෙළුම් මිලදී ගැනීමට අවශ්‍ය වූ මුළු මුදල කීය ද? රු. ..........
(ii) එක් එක් මිතුරා කොපමණ මුදලක් බැගින් යෙදුවේ ද? රු. ..........

[7 වැනි පිටුව බලන්න.

**45.** එක්තරා මෝටර් රථයක් පෙට්‍රල් ලීටරයකින් කිලෝමීටර 8 ක් ධාවනය කළ හැකි ය. පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 150 ක් නම් කිලෝමීටර 40 ක් ධාවනය කිරීමට අවශ්‍ය පෙට්‍රල් සඳහා යන වියදම කොපමණ ද?

රු. ................

**46.** පුස්තකාලයට පැමිණ එහි පැය 4 මිනිත්තු 30 ක් ගතකළ නිමල් ඉන් පිටව ගියේ පස්වරු 3.00 ට ය.

(i) නිමල් පිටව ගිය වේලාව, පැය 24 ඔරලෝසුව අනුව ලියන්න. පැය ................

(ii) නිමල් පුස්තකාලයට පැමිණි වේලාව කීය ද? පෙරවරු ................

**47.** 2012 වර්ෂයේ අගෝස්තු මාසයේ දී සුනිල්ගේ වයස අවුරුදු 10 මාස 5 ක් ද නිමල්ගේ වයස අවුරුදු 12 මාස 8 ක් ද වේ. දෙදෙනාගේ ම වයස්වල එකතුව සොයන්න. අවුරුදු ........ මාස ........


**48.** හිස්තැන් පුරවන්න :

| | |
|---|---|
| 1 kg | 750 g |
| + 2 kg | 500 g |
| ......... kg | ......... g |

**49.** ජලය ලීටර 1 මිලිලීටර 500 ක් වීදුරු හතරකට සමානව දැමූ විට එක් වීදුරුවක අඩංගු වන ජලය ප්‍රමාණය සොයන්න. (ලීටර 1 = මිලිලීටර 1000)

මිලිලීටර ..............


**50.**




රූපයේ දක්වෙන ත්‍රිකෝණයේ, පරිමිතිය (වටේ දිග) 10 m කි. එම ත්‍රිකෝණයේ AB පාදය 2 m 50 cm ක් ද BC පාදය 3 m 80 cm ක් ද වේ. AC පාදයේ දිග කොපමණ ද?


.........m .........cm

**51.** දී ඇති තොරතුරු අනුව, වගුවෙහි හිස්තැන සම්පූර්ණ කරන්න.




| සිට | තෙක් | දුර |
|---|---|---|
| කොළඹ | හම්බන්තොට | 245 km |
| කොළඹ | මාතර | 160 km |
| ගාල්ල | හම්බන්තොට | 125 km |
| ගාල්ල | මාතර | ......... km |

**52.** රූපයේ දැක්වෙන ආකාරයේ සිලින්ඩරයක ඇති



(i) තල පෘෂ්ඨ ගණන කීය ද? ..............................

(ii) වක්‍ර දාර ගණන කීය ද? ..............................

[8 වැනි පිටුව බලන්න.


53. (i) ප්‍රස්තාරයේ දක්වෙන තොරතුරු අනුව වගුවෙහි හිස්තැන පුරවන්න.

(ii) වගුවෙහි දක්වෙන තොරතුරු අනුව ප්‍රස්තාරය සම්පූර්ණ කරන්න.

(i)

| පලතුරු වර්ගය | පලතුරු සංඛ්‍යාව |
|---|---|
| අඹ | 18 |
| අන්නාසි | 20 |
| පේර | 25 |
| දෙඩම් | ...... |

(ii)




● පහත සඳහන් **හිස්තැන්** සම්පූර්ණ කරන්න.

54. බලවූ පොළොන්නරු අනුරාපුර පෙදෙස
සිතවූ පැවැති නිදහස මෙහි පෙර දවස
තාගවූ නව නවත් තිරසර තරුණ ගොස

.......................................................

55. "දරුව තොපගේ ඉතා හරබර වාරි කර්මාන්තය ගැන මම ඉමහත් සතුටට පත්වීමි. රට ජාතිය දියුණුවට හා මතු පරම්පරාවට තොපගේ වැව් කර්මාන්තය පිහිට වන්නේය" යි කියා .................. .................. රජතුමා බුලතාට ප්‍රශංසා කළේ ය.

56. ඔබ අප ජීවන වේ; අප .................. ඔබ වේ.

● පහත සඳහන් එක් එක් **හිස්තැනට** සුදුසු වචනය වරහන තුළින් තෝරා ඊට යටින් **ඉරක් අඳින්න.**

57. රසායනික ද්‍රව්‍ය සමඟ වීදුරු ප්‍රතික්‍රියා .................... (නොකරති/නොකරයි).

58. (සමහරකු/සමහරෙක්) .................... ප්‍රීතියෙන් කැගැසුවෝ ය.

59. (සත්තු/සතුන්) .................... ජම්බු හඬින් දියට පනිති.

60. 'ජාතික කොඩිය ජාතියක අභිමානය සංකේතවත් කරයි.' ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය පිළිබඳ ව වාක්‍ය **තුනක්** ලියන්න. (සෑම වාක්‍යයක් ම **වචන පහකට වැඩිවිය** යුතුයි. **උක්ත ආඛ්‍යාත සම්බන්ධය** හා **අක්ෂර වින්‍යාසය** නිවැරදි විය යුතුයි.)

(i) ..........................................................................................

..........................................................................................

(ii) ..........................................................................................

..........................................................................................

(iii) ..........................................................................................

..........................................................................................

* * *